# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/21 – 2012 ඔක්තෝබර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2012.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ යොමු අංකය: IR/10/65/2009.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත් වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2012 මාර්තු මස 08 වැනි දින දරන නියෝගයෙන්,

නිරංජන් උඩුමලගල මයා, අංක 252/2, ගලබඩ වත්ත, අතුරුගිරිය.

සහ

කොළඹ විශ්වවිද්‍යාලය, තැ.පෙ. 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.

අතර පවත්නා 2012 පෙබරවාරි මස 25 වන දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී. පියසෝම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2012 මාර්තු මස 08 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

11-148/1

මගේ යොමු අංකය: IR/10/65/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

නිරංජන් උඩුමලගල මයා, අංක 252/2, ගලබඩ වත්ත, අතුරුගිරිය.

සහ

කොළඹ විශ්වවිද්‍යාලය, තැ.පෙ. 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77හි, ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/10/65/2009.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

නිරංජන් උඩුමලගල මයා, අංක 252/2, ගලබඩ වත්ත, අතුරුගිරිය.

සහ

කොළඹ විශ්වවිද්‍යාලය, තැ.පෙ. 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.

**ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින් ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ සේවයේ යොදවා ඇති නිරංජන් උඩුමලගල මහතා වෙත ලේඛකාධිකාරිගේ 2007.03.15 වැනි දාතම දරන ලිපිය මගින් 2007 වර්ෂය සඳහා උපයා ගත්තා වූ වාර්ෂික වැටුප් වර්ධකය විලම්භනය කිරීම හා 2008 හා 2009 යන වර්ෂවල උපයා ගත් වැටුප් වර්ධකයන් ඔහුට නොදන්වා විලම්භනය කිරීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේද, එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

11 - 148/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.